WWW.OLEVELAPI.COM

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

නැටුම් (දේශීය)	**I, II**
நடனம் (சுதேச)	**I, II**
Dancing (Oriental)	**I, II**

පැය තුනයි
මූන්‍රු මණිත්තියාලම
Three hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නැටුම් (දේශීය) I

විශේෂ උපදෙස් :

* සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය, **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
* **II, III** සහ **IV** යන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

සැලකිය යුතුයි:

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) වරණ අතරින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

I කොටස

● අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු වචන තෝරන්න.

1. මහනුවර දළදා පෙරහරෙහි අවසන් දින පහ, වීදි සංචාරය කරනු ලබන්නේ ..... පෙරහැරයි.
(1) ඇතුළේ (2) කුඹල් (3) රන්දෝලි (4) දේවාල

2. ශාන්තිකර්මයන්හි දක්නට ලැබෙන **සංවාද** වැඩි වශයෙන් ..... රසයෙන් යුක්ත වේ.
(1) ශෘංගාර (2) හාස්‍ය (3) හාස (4) අද්භූත

3. සංගීතය, නර්තනය සහ චිත්‍ර යන කලා ත්‍රිත්වය සඳහා ම පොදු ලක්ෂණයක් **නොවන්නේ** ..... යි.
(1) රිද්මය (2) තාලය (3) සමබරතාවය (4) සන්නිවේදනය

4. උඩරට නර්තන සම්ප්‍රදායයේ හිස වෙස් මංගල්‍යයක දී සුබ නැකතින් පලඳවනු ලබන්නේ ..... යි.
(1) ජටාව (2) පායිම්පත (3) වෙස් තට්ටුව (4) ශිඛාබන්ධනය

5. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ලෝකධර්මී සහ ..... ලෙස ශෛලීන් දෙකකි.
(1) ස්වභාවධර්මී (2) නාට්‍යධර්මී (3) ශෛලිගත (4) තාත්ත්වික

6. වන්නමක බෙර පදයෙන් හිත මෙන් ම ..... නාදමාලාව ද හඳුනාගත හැක.
(1) තානමෙන් (2) ගායනයෙන් (3) කවියෙන් (4) රිද්මයෙන්

7. රති, හාස, සෝක ආදී මිනිස් සිතෙහි ඇතිවන හැඟීම් නිරූපණයේ දී ..... අභිනය ප්‍රමුඛ වේ.
(1) ආංගික (2) සාත්ත්වික (3) වාචික (4) ආහාර්ය

8. කෝලම් නාටකයේ දී සබයට පැමිණෙන චරිත හඳුන්වා දෙනු ලබන්නේ ..... විසිනි.
(1) කාරියකරවනරාළ (2) පනික්කළ (3) ආඩිගුරු (4) පොතේගුරු

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

9. 2024 වසරේ දිවිසැරියෙන් සමුගත් ..... ළමා මුද්‍රා නාට්‍යයේ උන්නතියට ඉමහත් සේවයක් කළ නර්තන ශිල්පිනියකි.
(1) ශ්‍රීමති රසාදරී (2) රැජිණි සෙල්වනායගම්
(3) පද්මිණි දහනායක (4) වජිරා චිත්‍රසේන

10. 'රනේ රුවසේ වත රුවින් දිලේදෝ' මෙය ..... කවියකි.
(1) ගොයම් (2) කුලු (3) මෝල්ගස් (4) නෙළුම්

11. ජාතික අධ්‍යාපන ආයතනයේ, සෞන්දර්ය අධ්‍යක්ෂ ධූරය දරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) තිලෝකසුන්දරී කාරියවසම් මිය (2) කමලා ජයතිලක මිය
(3) ශ්‍රියා රත්නකාර මිය (4) මිරැන්ඩා හේමලතා මිය

12. පළමුවන විමලධර්මසූරිය රජ සමයේ ලක්දිවට පැමිණි ලන්දේසි ජාතිකයෙකු වන්නේ,
(1) ඉබන්බතූතා ය. (2) රොබට් නොක්ස් ය. (3) ස්පිල් බර්ජන් ය. (4) පාහියන් හික්ෂුව ය.

13. පිළිවෙළින් ගොයම් නැටුම සහ කුලු නැටුමට සමාන දුවිඩ ගැමි නැටුම් ලෙස හැඳින්විය හැක්කේ,
(1) සෙම්බු සහ කෝලාට්ටම් ය. (2) කෝලාට්ටම් සහ කුම්මි ය.
(3) අරවිවෙට්ටු සහ සුලකු ය. (4) කුම්මි සහ සුලකු ය.

14. දැදිගම සූතිඝර චෛත්‍යයෙහි වූ එල්ලෙන ඇත් පහනෙහි ඇති ලෝහමය රූපය,
(1) නළඟනකගේ ය. (2) රබන් වාදකයෙකුගේ ය.
(3) හොරණෑ වාදකයෙකුගේ ය. (4) නටරාජාගේ ය.

15. 'රටයකුම හෙවත් රිද්දියාගය' නම් කෘතිය රචනා කරන ලද්දේ මහාචාර්ය
(1) ජයසේන කෝට්ටගොඩ විසිනි. (2) නිස්ස කාරියවසම් විසිනි.
(3) ලයනල් බෙන්තරගේ විසිනි. (4) ආරියරත්න කළුආරච්චි විසිනි.

● අංක **16** සිට **19** දක්වා ප්‍රශ්නවලට පහත ඡායාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.


P


Q


R


S

WWW.OLEVELAPI.COM

16. P රූපයේ දැක්වෙන අවස්ථාව අයත් වන්නේ,
(1) දෙවොල් මඩුවට ය. (2) සන්නි යකුමට ය.
(3) සොකරි නාටකයට ය. (4) කෝලම් නාටකයට ය.

17. Q රූපයේ දැක්වෙන වරිත වන්නේ,
(1) පරයා සහ ගුරුහාමි ය. (2) ගුරුහාමි සහ අප්පුහාමි ය.
(3) පරයා සහ වෙදරාළ ය. (4) ජසයා සහ හෙන්චා ය.

18. R රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ, බැරලයක ආකෘතිය ඇති සාය හඳුන්වන නාමය කුමක් ද?
(1) කුමීන් (2) පොශ්වාන් (3) රිෂම්පුරිට් (4) මයිකුම්

19. S රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය දක්වා ඇති වරණය තෝරන්න.
(1) පුං (2) චෙන්ඩා (3) තබ්ලා (4) පෙනා

20. සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් වන්නේ,
(1) බටුවත්ත සහ අම්බලන්ගොඩ ය. (2) කළුන්දැව සහ හඟුරන්කෙත ය.
(3) බෙන්තර සහ පාතහේවාහැට ය. (4) මිරිස්ස සහ මාතලේ ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

21. කෝලම් නාටකයට අයත් කවියක් දැක්වෙන වරණය කුමක් ද?
(1) ඔමරි කරන්නී තාලෙට පාද තබන්නී... (2) රුහුණු රටට ගොඩබසිමු කියන්නේ...
(3) මේ ගම් පියසේ හේනේ මාමලා... (4) මහ ජල මුහුදේ නැව පොඩි වෙන්නේ...

22. 'දියවන්නාව' ඉඟිනළුව නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
(1) එස්. පණිහාරත ය. (2) ප්‍රේමකුමාර එපිටවෙල ය.
(3) නිමල් වෙල්ගම ය. (4) වසන්ත කුමාර ය.

23. "තහළම් කළ බෙර තම්මැට පට තන්තිරි ඩමරු ....." මෙම කවිය ඇතුළත් සංදේශ කාව්‍යය කුමක් ද?
(1) තිසර (2) සැළලිහිණි (3) පරෙවි (4) මයුර

24. උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්මවල එන නාට්‍යමය පෙළපාලි තුන පිළිවෙළින් තෝරන්න.
(1) මී බන්ධනය, රාමා මැරීම සහ නයා යක්කම ය.
(2) වැදි යක්කම, අඹවිදමන සහ පොත්කඩේ පාලිය ය.
(3) ඌරා යක්කම, පොත්කඩේ පාලිය සහ මී බන්ධනය ය.
(4) නයා යක්කම, අසුර යක්කම සහ අඹවිදමන ය.

● අංක **25** සිට **28** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

	X	Y	Z
1	පන්තේරුව	ගැට බෙරය	දෙවොල් බෙරය
2	තම්මැට්ටම	දවුල	හොරණෑව
3	රබාන	තාලම්පට	උඩැක්කිය

25. හේවිසි වාදනය සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩ දැක්වෙන වරණය තෝරන්න.
(1) Y 1 හා Z 1 (2) X 2 හා Y 2 (3) Y 2 හා Z 2 (4) X 3 හා Y 3

26. මඟුල් බෙර වාදනය සඳහා යොදා ගන්නා බෙර වර්ග සඳහන් වරණය කුමක් ද?
(1) Y 1 හා Z 1 (2) X 2 හා Y 2 (3) Y 2 හා Z 2 (4) X 3 හා Y 3

27. නර්තනයේ යෙදෙමින් ම **වාදනය** කරන භාණ්ඩ දැක්වෙන්නේ,
(1) X 1 හා Y 1 (2) Y 1 හා Z 1 (3) Y 2 හා Z 2 (4) X 3 හා Z 3

28. අංජලිකා චිත්‍රසේන විසින් රංග රචනය කළ කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ සංගීතය නිර්මාණය කළේ,
(1) ටානියා බැරකෝමා ය. (2) රොබට් ජූලීන්හි ඇතුළු පිරිස ය.
(3) දේවි ශ්‍රී ප්‍රසාද් ය. (4) බාලසුන්දරම් ය.

29. බලි ශාන්තිකර්මය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) උඩරට නර්තන සම්ප්‍රදායෙහි එන ශාන්තිකර්මයකි.
(2) නවග්‍රහ අපල දුරුකර ගැනීම සඳහා පවත්වනු ලබයි.
(3) කඩවර සහ දෙවොල් දෙවියන් පුද ලබයි.
(4) පොල් පන්දම සහ අත්මිණිය රංගෝපකරණ වේ.

WWW.OLEVELAPI.COM

30. සිව්රැස් ලී පනේලයක පහත දැක්වෙන කැටයම දැකිය හැකි වන්නේ,



(1) පොළොන්නරුව ශිව දේවාලයේ ය.
(2) ඇම්බැක්ක දේවාලයේ ය.
(3) පනාපිටිය අම්බලමේ ය.
(4) දෙවුන්දර දේවාලයේ ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

II කොටස - උඩරට නර්තනය

31. මහ තනිතිතට නර්තනය කරන වන්නමකට සුදුසු අඩව්වක් වන්නේ,
(1) තාම් දොමිතිගත ..... ය. (2) තත් තකට තකරොං ..... ය.
(3) ගත්ත තෙහිඟු ..... ය. (4) රැදග ජිත්තක ..... ය.

32. ගැට බෙරයේ 'තත්' යන බීජාක්ෂරයෙන් උපදින අනු අක්ෂරයක් වන්නේ,
(1) දොං ය. (2) කුං ය.
(3) ජිත් ය. (4) ගත් ය.

33. "දෙංතකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට" මෙම අලංකාර බෙර සරඹය අයත් තාල රූපය වන්නේ,
(1) සුළු තනි තිත ය. (2) මැදුම් තනි තිත ය.
(3) සුළු මැදුම් දෙතිත ය. (4) සුළු මහ දෙතිත ය.

34. උඩරට වන්නම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දෙවුන්දර උපුල්වන් දේවාලයේ ගායනය කර ඇත.
(2) සෙබළුන්ගේ ආශ්වාදය පිණිස ගායනය කර ඇත.
(3) විනෝදාස්වාදය සඳහා කවිකාර මඩුවේ ගායනා කර ඇත.
(4) විනෝදාස්වාදය සඳහා රාජසභාවේ ගායනා කර ඇත.

35. කොහොඹා කංකාරියේ ගායනය සහ නර්තනය ඇතුළත් පෙළපාලි අංග වන්නේ,
(1) කොහොඹාහැල්ල සහ යක්ඇනුමයි. (2) කොහොඹාහැල්ල සහ අස්නයි.
(3) මඩුපුරය සහ ආවැන්දුමයි. (4) මඩුපුරය සහ යක්තුන් පදයයි.

36. කොහොඹා කංකාරියේ ගුරුගේ මාලාව සහ ගබඩා කොල්ලය වඩාත් නිවැරදිව හඳුන්වා ඇති වරණය තෝරන්න.
(1) නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරයි. (2) වාදනය සඳහා ප්‍රධාන තැනක් හිමිවේ.
(3) චාරිත්‍ර විධි දෙකකි. (4) ගායනය සහිත නර්තන අංග දෙකකි.

37. මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් ඇතුළත් වරණය කුමක් ද?
තත්තොඟ ..... තක්කඩ තරිකිට .....
(1) තත්තොඟ - කිටිතක (2) තකතොඟ - තකතොඟ
(3) තකරොං - තකරොං (4) ජිකරොං - තකතොඟ

38. 'ජෙං තත්තත් ///..... ජෙං තා' මෙය,
(1) තනි තිතට අයත් කස්තිරමකි. (2) තනි තිතට අයත් අඩව්වකි.
(3) දෙතිතට අයත් කස්තිරමකි. (4) දෙතිතට අයත් අඩව්වකි.

39. "හිසට හිසලන්න ජගලත්තු තොප්පියක්" මෙම කවිය ඇතුළත් පෙළපාලි අංගය වන්නේ,
(1) නයා යක්කමයි. (2) උෂරා යක්කමයි.
(3) ගබඩා කොල්ලයයි. (4) පලවැල දානයයි.

WWW.OLEVELAPI.COM

40. තුන් තිතේ තාල රූපයට වාදනය කළ හැකි උඩරට බෙර පදය කුමක් ද?
(1) ජිංගත ගො ගො (2) දොං දොං ජිං ජිං ගජිගත
(3) දෝං ජිං ජිං තකට දොම්තක (4) කුඳංත ගත දොම්

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

III කොටස - පහතරට නර්තනය

31. මහ තනි තිතට නර්තනය කරන සින්දු වන්නමකට සුදුසු ඉරට්ටියක් වන්නේ,
(1) තකදිත් තකදොම් ..... ය. (2) දොම් තත්දිම් ..... ය.
(3) ගුම්දත් ගුහිතිගදිරිකිට ..... ය. (4) තත් ගුදගත ..... ය.

32. පහතරට බෙරයේ 'තත්' යන බීජාක්ෂරයෙන් උපදින අනු අක්ෂරයක් වන්නේ,
(1) දොං ය. (2) ගුං ය.
(3) දිත් ය. (4) ගත් ය.

33. "ගුදි ගුඳ ගුදි ගුඳ ගත ගදි ගත ගදි ගත ගත"
මෙම අලංකාර බෙර පදයට අයත් තාලරූපය වන්නේ,
(1) මාත්‍රා 2 තනි තිත ය. (2) මාත්‍රා 3 තනි තිත ය.
(3) මාත්‍රා 2+3 දෙතිත ය. (4) මාත්‍රා 2+4 දෙතිත ය.

34. පහතරට සින්දු වන්නම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) රත්නපුර සමන් දේවාලයේ ගායනය සඳහා බිහි වී ඇත.
(2) මාතර කවිකාරමඩුවේ ගායනය සඳහා බිහි වී ඇත.
(3) දෙවුන්දර උපුල්වන් දේවාලයේ පුද පූජාවලදී ගායනය කර ඇත.
(4) දෙවුන්දර සමන් දේවාලයේ ගායනය කර ඇත.

35. දෙවොල් මඩුවේ ගායනය සහ නර්තනය ඇතුළත් පෙළපාලි අංග වන්නේ,
(1) පත්තිනි සහ යහන් දැක්ම යි. (2) තොරන් යාගය සහ පත්තිනි නර්තනය යි.
(3) දෙවොල් සහ මුගුරු පද යි. (4) තොරන් යාගය සහ මුදුන් තාලය යි.

36. දෙවොල් මඩුවේ අඹවිදමන සහ ඇත්බන්ධනය වඩාත් නිවැරදිව හඳුන්වා ඇති වරණය තෝරන්න.
(1) නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරයි. (2) වාදනය සඳහා ප්‍රධාන තැනක් හිමි වේ.
(3) චාරිත්‍ර විධි දෙකකි. (4) ගායනය සහිත නර්තනාංග දෙකකි.

37. මෙම ඉරට්ටිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් ඇතුළත් වරණය කුමක් ද?
තත් ගුදගත ..... ගත ගුඳ ගත .....
(1) ගුං දිත් තෙයි - ගත් දිත් තෙයි (2) දිත් දිත් තෙයි - දිත් දිත් තෙයි
(3) දොම් දිත් තා - ගත් දිත් තා (4) රෙගදිත් තෙයි - දෙගදිත් තෙයි

38. "දොම් තම්ගත ගදිතම්ගත ....." මෙය
(1) තනිතිතට අයත් අන්තාඩියකි. (2) දෙතිතට අයත් අන්තාඩියකි.
(3) තනිතිතට අයත් බෙර පදයකි. (4) දෙතිතට අයත් බෙර පදයකි.

39. "එක් සැරයටියක් සුරතින් දරා ....." මෙම කවිය භාවිත වන්නේ,
(1) රාම මැරීමේ දී ය. (2) අඹවිදමනේ දී ය.
(3) මී බන්ධනයේ දී ය. (4) දෙවොල්ගොඩ බැසීමේ දී ය.

WWW.OLEVELAPI.COM

40. තුන්තිතේ තාල රූපයට වාදනය කළ හැකි පහතරට බෙර පදය කුමක් ද?
(1) ගුංඳ දෙගත ගතිගත ගුඳ (2) රෙගුං ගුඳං ගත් දෙගත් ගතකු දොං
(3) ගුංඳ ගත්ගත ගත්ත ගුංගුඳ (4) දිත් තම් දිතකු දොම් දොම් තාම්

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

IV කොටස - සබරගමු නර්තනය

31. මහ තනි තිතට නර්තනය කරන වන්නමකට සුදුසු අඩව්වක් වන්නේ,
(1) ගත්තකු ජිත්තත් ..... ය. (2) ජිංත ගත්තත් ..... ය.
(3) තක් කිටහර් ..... ය. (4) තාත් තත්ජිත් ..... ය.

32. දුවුලෙහි 'තත්' යන බීජාක්ෂරයෙන් උපදින අනු අක්ෂරයක් වන්නේ,
(1) දොං ය. (2) කුං ය.
(3) ජෙං ය. (4) ගත් ය.

33. 'ජිංතක ජිං ජිමි තත් තත්තක තත් කිටිතක' මෙම අලංකාර බෙර පදය අයත් තාල රූපය වන්නේ,
(1) සුළු තනි තිත ය. (2) මැදුම් තනි තිත ය.
(3) සුළු මැදුම් දෙතිත ය. (4) සුළු මහ දෙතිත ය.

34. සබරගමු වන්නම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) රජුන් පිනවීම සඳහා දෙවුන්දර උපුල්වන් දේවාලයේ ගායනා කර ඇත.
(2) දෙවියන් පිනවීම සඳහා සබරගමු සමන් දේවාලයේ ගායනා කර ඇත.
(3) විනෝදාස්වාදය සඳහා සබරගමු සමන් දේවාලයේ ගායනා කර ඇත.
(4) විනෝදාස්වාදය සඳහා සබරගමු උපුල්වන් දේවාලයේ ගායනා කර ඇත.

35. පහන්මඩුවේ ගායනය සහ නර්තනය ඇතුළත් පෙළපාලි අංග වන්නේ,
(1) තොරන් යාගය සහ මුදුන් තාලයයි. (2) දෙවොල් සහ මල්මඩුපුරයයි.
(3) දෙවොල් සහ මුගුරුපදයි. (4) මල්මඩුපුරය සහ යහන්දැක්ම ය.

36. පහන්මඩුවේ අසුර යක්කම සහ රාමා මැරීම වඩාත් නිවැරදිව හඳුන්වා ඇති වරණය තෝරන්න.
(1) නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරයි. (2) වාදනය සඳහා ප්‍රධාන තැනක් හිමිවේ.
(3) චාරිත්‍ර විධි දෙකකි. (4) ගායනය සහිත නර්තන අංග දෙකකි.

37. මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් ඇතුළත් වරණය කුමක් ද?
ජිංත ගත්තත් ..... ගත දොං ..... ගත ගත
(1) ගතිත - ගතිත (2) ගතිත - ජිංත
(3) ජිමිත - ජිමිත (4) ගතත් - ජිමිත

38. ජිංත ගත ගත ගදිත කුඳ කුඳ ..... මෙය,
(1) තනි තිතට අයත් අඩව්වකි. (2) තනි තිතට අයත් කලාසමකි.
(3) දෙතිතට අයත් අඩව්වකි. (4) දෙතිතට අයත් කලාසමකි.

39. "එක් සැරයටියක් සුරතින් දරා ....." මෙම කවිය ඇතුළත් පෙළපාලි අංගය වන්නේ,
(1) රාමා මැරීමයි. (2) අඹවිදමනයි.
(3) පොත්කඩේ පාලියයි. (4) දෙවොල්ගොඩ බැසීමයි.

WWW.OLEVELAPI.COM

40. තුන් තිතේ තාල රූපයට වාදනය කළ හැකි සබරගමු බෙර පදය කුමක් ද?
(1) ජිංත ජිමිත්තත් තක්කිට කිටිතක (2) ජිං කිටිතක් තක් කිටිතක
(3) ජිංතක ජිං ජිමිතත් තත්තක තක් කිටිතක (4) ජිං කුඳ කුඳ තක්කිට කිටිතක

❊ ❊

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...